# අධිකරණ සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා අධිකරණ සේවයේ පුරප්පාඩු

### ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරී (මහේස්ත්‍රාත්) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්, සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2020.11.06 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

02. වැටුප් ක්‍රමය - රු. 75, 000 - 10 X 1630 - 91,300 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2018 අනුව). අධිකරණ නිලධාරීන්ට හිමි දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

03. සෑම අයදුම්කරුවෙක්ම -

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ආ. විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

ඇ. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් :

අ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු දෙකකට නොඅඩු සේවා කාලයක් ඇති කම්කරු විනිශ්චය සභා සභාපතිවරයකු වීම

හෝ

ආ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු හතරකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයකු වීම.

හෝ

ඇ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් අමාත්‍යාංශයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අවුරුදු හතරකට නොඅඩු කාලයක් නීති නිලධාරියකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම.

හෝ

ඈ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධාරියකු ලෙස අවුරුදු හතරකට නොඅඩු කාලයක් සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම.

05. සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**සටහන :**

01 අයදුම්පත් ගාස්තුව රු. 4,000/- කි. එම මුදල මහජන බැංකුවේ, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක. 297100190025030 දරන **"ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව"** යන ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් හෝ පෞද්ගලිකව පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් අයදුම්පත් ලබාගත හැක. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේදී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

02. ලියාපදිංචි තැපැලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

03. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් ලබා ගැනීම සහ ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය:**

**ලේකම්,**
**අධිකරණ සේවා කොමිෂන් සභාව,**
**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,**
**කොළඹ 12.**

**එච්. සංජීව සෝමරත්න**
**ලේකම්,**
**අධිකරණ සේවා කොමිෂන් සභාව.**

**2020 සැප්තැම්බර් මස 22 වන දින,**
**කොළඹ 12,**
**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.**

Source: Dinamina, Daily News (2020.10.02)